**සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය - 2016/2017**

**-------------------------------------------------------------------------**

සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනයේ 2016 හා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ ගණුදෙනු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධිවිධාන යටතේ විගණනය කරන ලදී. කර්මාන්තායතනය විසින් ඉදිරිපත් කළයුතු 2016 හා 2017 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන කර්මාන්තායතනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**------------------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කර්මාන්තායතනයේ 2016 හා 2017 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 අඛණ්ඩ පැවැත්ම**

**-----------------------------**

1993 වර්ෂයේ පුද්ගලීකරණයට යටත් වූ මෙම ආයතනය අසාර්ථක වීම හේතුවෙන් 1997 වර්ෂයේදී නැවත රජයට පවරා ගෙන තිබුණි. එහෙත් 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවූ බැවින් 2001 වර්ෂයේදී වන්දි ගෙවා සියලු සේවකයන්ගේ සේවය අවසන් කර තිබුණු අතර කර්මාන්තායතනයට අයත් ඉඩම්වලින් කොටසක් සහ ගොඩනැගිලි අවුරුදු 30 ක බදු පදනම මත ලබාදී ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම පිහිටුවා තිබුණි. ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා 2016 වර්ෂයේදී සේවකයන් 09 දෙනෙකු සේවයේ යොදවා තිබූ නමුත් වර්තමානය වන විට තාවකාලිකව පත් කරන ලද සාමාන්‍යාධිකාරීවරයෙකු පමණක් සේවයේ යෙදී සිටින අතර ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට රු.1,445,210,731 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතුණි. ඒ අනුව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.3 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම.**

**----------------------------------------------------**

2016 සහ 2017 වර්ෂවලට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.4 වත්කම් හා වගකීම් වල පැවැත්ම.**

**-------------------------------------------**

කර්මාන්තායතනය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 153,005,563 |
| ජංගම වත්කම් | 147,279,541 |
| මුළු වත්කම් | 300,285,104 |

| බැරකම් | |
|---|---|
| ජංගම බැරකම් | 83,806,918 |
| ජංගම නොවන බැරකම් | 1,661,688,913 |
| | 1,745,495,831 |
| ශුද්ධ වත්කම් / අයිතිය | (1,445,210,731) |
| මුළු බැරකම් හා හිමිකම | 300,285,100 |

| | |
|---|---|
| මුළු ආදායම | 11,702,140 |
| මුළු වියදම | 10,193,734 |
| අතිරික්තය / ඌණතාවය | 1,508,406 |

## 2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2017 වර්ෂයට අදාළ ගෙවීම් වවුචර් සහ මුදල් පොත විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම් සහ ලැබීම් පරීක්ෂා කිරීමට නොහැකි විය. තවද, කර්මාන්තායතනය සතුව තිබෙන වත්කම් සම්බන්ධයෙන් වසර 20 කට අධික කාලයක සිට භෞතික සත්‍යාපනයක් සිදුකිරීමට කටයුතු කර නොතිබූ බැවින් වත්කම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමටද නොහැකි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

1998 වර්ෂයේ සිට කර්මාන්තායතනයේ කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ වත්කම් නිෂ්ක්‍රීයව පැවති අතර එම වත්කම් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. තවද, වර්ෂයේ වියදම් ලෙස වැටුප් ගෙවීම, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ඉන්ධන වියදම් ආදිය වෙනුවෙන් රු.3,341,294 ක් වැය කර තිබූ අතර එම වියදම් පියවීම සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් රු.2,887,610 ක් ලැබී තිබුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කර්මාන්තායතනයට අයත් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාළ කම්හල් ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙත 2007 වර්ෂයේදී ලබා දී තිබුණි. 2009 මාර්තු 06 දිනැති අංක 09/0398/329/003 සහ 2009 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගිවිසුමක් පිළියෙල කොට ඒ සඳහා නීතිපතිගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද, මෙම වාර්තාවේ දින දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 20 කට පමණ පෙර ගොවීන් 4493 ක් අතර ඉඩම් අක්කර 2.5 බැගින් අක්කර 11232 ක් බදු ගිවිසුම් වලින් ලබා දී තිබුණද, එම ඉඩම්වලින් බදු මුදල් අයවී නොතිබුණු අතර බදු ගිවිසුම්වල කාලයද ඉකුත් වී තිබුණි. ඒ අනුව ඉඩම් ආපසු ලබා ගැනීමට හෝ අලුතින් බදු ගිවිසුම් අත්සන් කර ඒවා පැවරීමට හා බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) කර්මාන්තායතනයට අයත් නිල නිවාස 273 කින් නිවාස 91 ක අනවසර පංදිංචි කරුවන් පදිංචි වී සිටින අතර ඔවුන් ඉවත් කිරීමට නීතිමය කටයුතු කර නොතිබූ අතර අනෙකුත් නිවාස වලින් කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නාරාහේන්පිට කාර්යාලය තුල, බෝතල් නිෂ්පාදනාගාරයට අයත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, යතුරුපැදි 3 ක් මෝටර් රථයක් හා හිඟුරාන කම්මල් පරිශ්‍රයේ තිබෙන යන්ත්‍ර උපකරණ ඇතුලු වත්කම් 1997 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. කෙසේ වුවද කර්මාන්තායතනයේ පවතින සියලු වත්කම් පිළිබඳව රජයේ තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කළයුතු බවට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 පෙබරවාරි 27 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණු අතර 2017 පෙබරවාරි මස පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්ද කර්මාන්තායතනය ඈවර කිරීම සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු බවට නියෝග කර තිබුණි. එහෙත් මෙම වාර්තාවේ දින දක්වාම ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) සේවකයින් ඉවත් කිරිමට පෙර හිඟුරාන පරිශ්‍රය තුල සහ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ එම සේවකයින් භාරයේ තිබුණු වත්කම් නිසි පරිදි වගකිවයුතු නිලධාරීන්ට භාරදීමට අවශ්‍ය කටයුතු නොකර සේවකයන් ඉවත් කර තිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

----------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර කර්මාන්තායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| | ------------------------------ | ---------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ආයතනය සතු වත්කම් නිශ්චිත ලෙස හඳුනා ගෙන එම වත්කම් තක්සේරු කිරීමටත්, ලේඛනගත කිරීමටත් කටයුතු නොකිරීම. |
| (ආ) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ පාලනය | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට සහ ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |